**කින්නියා නගර සභාව**

**-------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**----------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශ**

**--------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

**------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 මැයි 06 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 19 දින ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 01 දින සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කින්නියා **නගර** සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්**

**--------------------------------------**

**1.3.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම.**

**-----------------------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශයන් සමඟ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2** **ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂය සඳහා ලැබිය යුතු රු.1,220,950 ක් වූ මුද්දර ගාස්තු ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂය සඳහා ලැබිය යුතු රු.1,426,867 ක් වූ උසාවි දඩ ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය තුල අයකරගත යුතු තක්සේරු බදු මුදල රු.2,196,642 ක් වුවත් මෙම ලැබිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශයන්හි රු.1,923,043 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් අයවිය යුතු තක්සේරු බදු රු.273,599 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.1.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2006 වර්ෂයේ සිට හිඟහිට ඇති සහ මූල්‍ය ප්‍රකාශයන්හි දිගින් දිගටම දක්වමින් පවතින රු.2,457,554 ක් වූ මස් වෙළඳසැල් බදු කුලී සහ රු.4,613,353 ක් වූ මාළු වෙළඳසැල් බදු කුලී අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

**1.1.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 40,325,057 | හිමිකම් ඔප්පු |
| පිරියත් සහ යන්ත්‍රසූත්‍ර | 4,638,775 | |
| මෝටර් වාහන | 14,216,506 | ස්ථාවර වත්කම් ලේඛනය සහ |
| ලීබඩු සහ සවිකිරීම් | 4,246,857 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| කාර්යාල උපකරණ | 3,061,520 | |
| ණය හිමියෝ | 2,398,969 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

**1.1.3 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණ විය.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නගර සභා ආඥා පනත (පරිච්ඡේදය 255) | |
| (i) 177 (2) වගන්තිය | සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශයන්හි උද්ධෘතයක් මහජනයාගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 180 (1) වගන්තිය | සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සභාපති විසින් විස්තරාත්මක වාර්ෂික පරිපාලන වාර්තාවක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

(ආ) නගර සභාවේ මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි අංක 174 - 2014 වර්ෂය සඳහා වූ ආදායම් ලෙජරයේ ආරම්භක ශේෂ, ලැබීම් සහ ගෙවීම් සටහන් සම්පූර්ණ කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි අංක 178 - වර්ෂය අවසානයේ විස්තරාත්මක ආදායම් තැන්පතු ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි 700 (5) - ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 07 ක් වෙනුවෙන් ටෙන්ඩර් මණ්ඩල තීරණ සහ කොන්ත්‍රාත් පිළිගැනීමේ ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 702 (3) - රු.6,957,659 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 07ක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් සමඟ එළැඹි ගිවිසුම්වල පිටපත් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 571 (1) කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික ප්‍රකාශ පිළියෙල කොට විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.6 නිෂ්ක්‍රීය වත්කම්

-----------------

පහත සඳහන් වත්කම් අළුත්වැඩියා කොට ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු නොකොට වර්ෂ 03 සිට 07 දක්වා කාල පරිච්ඡේදයන් තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

| වත්කම් වර්ගය | වටිනාකම | නිෂ්ක්‍රීය කාල පරිච්ඡේදය |
|---|---|---|
| | රු. | |
| ට්‍රැක්ටරය | 716,000 | වර්ෂ 5 |
| රෝද දෙකේ ට්‍රැක්ටරය | 34,137 | වර්ෂ 7 |
| ටිපර් රථය | 5,098,000 | වර්ෂ 3 |
| සිමෙන්ති මිශ්‍රණ යන්ත්‍රය | 300,000 | වර්ෂ 4 |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු2,813,401 ක් වූ අතර, එයට එරෙහිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම් අතිරික්තය රු.20,386,740 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.23,200,141. ක වර්ධනයක් දැක්විණි.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සභාවේ සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වෙනස | රැස්කළ ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| තක්සේරු බදු | 3,128,000 | 1,189,196 | 1,938,804 | 40 |
| බදු කුලී | 10,666,750 | 8,372,290 | 2,294,460 | 56 |

#### 2.2.2 බලපත්‍ර ගාස්තු

---------------

සමාලෝචිත වර්ෂය තුළ සභාවේ බල ප්‍ර දේශය තුල ස්ථාපනය කරන ලද දැන්වීම් පුවරු 14 ක් වෙනුවෙන් බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 බදුකුලී

--------

(අ) සභා බල ප්‍රදේශය තුල මාළු වෙළඳසැල් 02 ක් සහ එළු මස් වෙළඳසැල් 12 ක් පැවතුණි. එක් එක් වෙළඳසැල වෙන වෙනම වෙනස් පුද්ගලයන්ට භාරදෙනු වෙනුවට මෙම සියළුම වෙළඳසැල් පුද්ගලයන් දෙදෙනෙකුට බදු කුලී පදනම මත ලබාදී තිබුණි. මෙම සියළුම වෙළඳසැල් එකම පුද්ගලයන් දෙදෙනෙකුට ලබාදි තිබීම නිසා සභාව එම පුද්ගලයන්ට මෙම වෙළඳසැල් අතුරු බදුදී ඉතා පහුවෙන් මුදල් ඉපැයීමට ඉඩ සලසා දී තිබුණි. එබැවින් සභාවට සැලකිය යුතු ආදායම් ප්‍රමාණයක් අහිමි වී තිබුණි.

(ආ) 2009 වර්ෂයේ සිට 2014 දක්වා හිඟ හිට තිබු වෙළඳපොල සති කුලී රු.232,868 ක් සහ කුකුළු මස් වෙළඳසැලෙහි බදු කුලී රු.32,667 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.4 වරිපනම් සහ බදු

-------------------

2006 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති ඉඩම් සහ ඉදිකළ නිවාස සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ (පරිච්ඡේදය 255) 160 වගන්තිය ප්‍රකාරව අයකරගත යුතු එකතුව රු.2,196,642 ක් වූ වරිපනම් අයකර ගෙන නොතිබුණි.

2.2.5 විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු

--------------------------------------

සභා බල ප්‍රදේශය තුල ස්ථාපනය කරන ලද විදුලි සංදේශ කුළුණු 08 ක් වෙනුවෙන් සභා තීරණ අංක 273 ප්‍රකාරව ආදායම් පරිපාලන ගාස්තු අය නොකිරීම නිසා සභාවට රු.48,000 ක් වූ ආදායම් අහිමි වී තිබුණි.

2.2.6 උසාවි දඩ

-----------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් අයකරගත් උසාවි දඩ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන්2014 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ සංවිධානයන් විසින් පරිත්‍යාග කරන ලදුව සභාව විසින් වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ ප්‍රයෝජනයට ගනු ලබන වාහන 08 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වට්ටෝරු භාණ්ඩ විෂයයන් 109 ක් සහ පුස්තකාල පොත් 3,905 ක් වූ ඌනතාවයන් පිළිබඳව 2011,2012,2013 සහ 2014 වර්ෂයන් සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හි සඳහන් කර තිබුණු නමුත් සභාව විසින් මේ සම්බන්ධයෙන් නිසි කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය නොකිරීම නිසා සභාවට සමාලෝචිත වර්ෂය තුල පිළිවෙලින් රු.135,553 ක් සහ රු.26,359 ක් වූ අධිභාර ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) අංක 9/2009 සහ 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව වේලා සටහන් කිරීමේ යන්ත්‍රයක් ස්ථාපනය කළයුතු වුවද, මෙම යන්ත්‍රය සවිකර නොතිබුණි.

(ඉ) නියමිත කාලය තුළදී පොදු වෙළඳපොළෙහි වතුර බිල්පත් සහ විදුලි බිල්පත් නිරවුල් නොකිරීම නිසා සභාව රු.6,720 ක් වූ දඩ මුදල් ගෙවා තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පුර නැගුම (NELSIP) ව්‍යාපෘතිය යටතේ කට්ටයාරු - මලින්තුරේ මාර්ගයේ කොන්ක්‍රීට් ගඩොල් ඇතිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුමකට එලඹී තිබුණු අතර, පසුව නියමිත කාලය තුල කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව සම්පූර්ණ නොකිරීම නිසා කොන්ත්‍රාත්තුව නවතා දමා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද වටිනාකම රු.579,156 ක් වූ කාර්යසාධන බැඳුම්කරය නියමිත කාලය තුලදී සභාව විසින් මුදල් කරගෙන නොතිබුණි.

3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

ඝණ අපද්‍රව්‍ය අපහරණය සඳහා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 3.75 ක පිරිවැයට මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණ නමුත් එම මධ්‍යස්ථානයේ මෙහෙයුම් නිසි පරිදි සිදු නොවීම නිසා ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සියයට 27 සිට සියයට 100 දක්වා පරාසයක වූ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛන ඵලදායී කළමනාකරණ පාලන ඒකකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | අතිරික්ත | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | 02 | - | - | 02 |
| සහායක | 27 | 24 | - | 03 |
| සුළු සේවකයන් | 80 | 69 | - | 11 |
| තාවකාලික/දෛනික වේතන ලබන සේවකයන් | - | 16 | 16 | - |
| එකතුව | 109 | 109 | 16 | 16 |

ලේකම් සේවයේ II පන්තියේ III ශ්‍රේණියේ සහ ගණකාධිකාර සේවයේ II පන්තියේ III ශ්‍රේණියේ තනතුරු ඉකුත් වර්ෂ 5 තිස්සේ පුරප්පාඩුව පැවති නමුත් මෙම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) ආදායම් කළමනාකරණය
(ඉ) අයවැය පාලනය